


**ශ්‍රී. බු. ව. 2556 ඇසළ මස කලාපය, රා. ව. 2012 ක් වූ ජුලි මස 03 වන දින**

**මාතර,ශ්‍රී සුදර්ශී විද්‍යායතන පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**පව්න් වැලකී යහපතෙහි යෙදෙමු.**

**(ධමම පදයේ බාලවගගය ඇසුරිනි.)**

**ගෞරවණීය ස්වාමීන් වහන්ස,**
**කාරුණික පින්වත්නි,**

**අද ඇසළ පුර පසළොස්වක පොහොය දිනයයි. ශාසන ඉතිහාසයෙහි ඉතා වැදගත් කරුණු රාශියක් මෙම පොහොය දින සිදුවිය. අප මහ බෝසතාණන් වහන්සේ තුසිත දෙව්ලොවින් චුතව මහාමායා දේවියගේ කුස පිළිසිඳගත්තේ අද වැනි පොහොය දිනයක ය.**

**බෝසතාණන් වහන්සේ ගිහි ගෙදර ගිහි සැප ආශ්වාද කොට එහි ආදීනව දැක නිශ්සරණයට පත්වී අභිනිෂ්ක්‍රමණය කළේ ද අද වැනි ඇසළ පුර පසළොස්වක පොහොය දිනකය. ගිහිගෙයින් නික්මුණු බෝසතාණන් වහන්සේ සියලු කෙලෙස් නැති කොට බුද්ධත්වයට පත්වී මුලින්ම බරණැස ඉසිපතන නම් වූ මිගදායේදී දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කොට විශ්ව සාධාරණ අනිත්‍යතාවය ලොවට හෙළිකලේ අද වැනි පොහොය දිනයකය. තුණුරුවන් ලෝකයෙහි පහළ වීම, මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කිරීම ආදී කරුණු සිදුවූ අද දින උපසපන් භික්ෂූන් වහන්සේලා පොහොය කිරීම් ආදිය සිදුකොට වස් විසීමේ චාරිත්‍රය ඉටුකරනු ලැබේ.**

බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ ඉතා වටිනා සිදුවීම් රාශියක් ඉටු වී තිබෙන අද වැනි දිනක අප කල්පනා කළ යුත්තේ තථාගතයන් වහන්සේ නමක් ලොවට බිහිවන්නේ කවර පරමාර්ථයක් මතද යන්න ගැනය. බුදුන්වහන්සේ නමක් ලොවට පහළ වන්නේ සමාජගත පුද්ගලයින් පවින් වළකා යහපතෙහි පිහිටුවීමටයි. බාලයාගේ ලක්‍ෂණය වන්නේ පව්කම් කරමින් සසර දිගුකර ගැනීමයි. ඒ බාල ලක්‍ෂණ හඳුන්වා දී ඔහු පණ්ඩිතයෙකු කොට සසර කෙටිකර දීම බුදුන්වහන්සේගේ කාර්ය භාරයයි.

ධම්ම පදයේ බාල වර්ගය වෙන්වී තිබෙන්නේ බාලයාගේ බාල ලක්‍ෂණ හඳුන්වා දීමටයි. එදා භාරතයේ ජීවත් වූ සාමාන්‍ය ජනතාවගේ මනස තේරුම් ගනිමින් ඔවුන්ට වැටහෙන සරල උපමා යොදා ගනිමින් මෙම දේශනා පවත්වා ඇත. අද මෙම සදහම් පණිවිඩයෙන් සිහිපත් කරන්නේ එවැනි බාල ලක්‍ෂණ සඳහන් එක් ගාථාවකි.

"නහි පාපං කතං කමමං සජ්ජු ඛීරංව මුචචති
ඩහං තං බාල මණෙවති භසමචඡනෙනාව පාවකො ..."

යනු එම ගාථාවයි. මෙම ගාථාවේ සරල අර්ථය විමසා බලමු. දෙවූ කෙනෙහි කිරි නොමිදෙන්නා සේ පවද කළ කෙනෙහිම විපාක නොදෙන්නේ ය.

පව්කම් කරන බාලයා ඉතා සතුටින් ජීවත්වන්නේ කළ පව ඒ මොහොතේම විපාක නොදෙන නිසා ය. මෙහිදී බුදුන් වහන්සේ උපමා දෙකක් භාවිතා කොට ඇත. දෙවූ කෙනෙහි කිරි සහ අලුයට සැඟවුන ගිනි පුපුර යනු ඒවා ය. එළදෙන ගෙන් කිරි දොවාගත් විටම ඒවා නොමිදේ ඒ සඳහා කිසියම් කාලයක් අවශ්‍ය ය. එම කිරි ටික උණු කළ යුතුයි. පසුව එම කිරිවලට මෝරු ආදී ඇඹුලක් මුහු කළ යුතුයි. ඉන් පසු ටික වේලාවක් ගිය පසු මිදුනු කිරි බවට පත්වේ. කළ පව එකෙනෙහිම විපාක නොදේ යන්න පැහැදිලි කිරීම සඳහා ගත් උපමාව කොතරම් සරල ද. ඊළඟ උපමාව අලුයට සැගවුණු ගිනි පුපුරයි. අලු ගොඩක් යට ගිනි පුපුරක් ඇති බව නොපෙනේ. නමුත් එයට අත දැමුවොත් අත පිළිස්සෙයි. පුද්ගලයා කළ පවද අලුයට සැගවුනු ගිනි පුපුර මෙන් සිට ඔහු දවාලන බව මෙයින් කියවේ.

මෙම ගාථාව බුදුන්වහන්සේ දේශනා කළේ අහිප්‍රේතයා නිමිතිකර ගෙනය. එම නිදාන කථාව තේරුම් ගැනීම මෙහිදී වැදගත් වේ. රජගහනුවර පිහිටි ගිජ්ඣකූළු පව්වේ සිට මහ මුගලන් හිමියන් සහ ලකඛණ හිමියන් පහළට වැඩම කරති. එහිදී උන්වහන්සේලා දෙනම ප්‍රේතයෙකු දුටහ. මෙම ප්‍රේතයාගේ හිස මිනිස් හිසක් මෙනි. සිරුර ගව් සීයක් පමණ දිගය. එම දිග සිරුර නාගයෙකුගේ මෙනි. හිසින් නැගෙන ගිනිදැල් කඳ පුළුස්සාගෙන නගුට දක්වා ගමන් කරයි. නගුටෙන් නැගෙන ගිනිදැල් හිසදක්වා අවුත් පුළුස්සා දමයි. කඳ මැදින් නැගෙන ගිනිදැල් දෙපස පුළුස්සා දමයි. පව්කල බාලයින් විඳිනා මේ දුක ගැන මෙනෙහි කරමින් මහ මුගලන් හිමියන් මේ බව බුදුන්වහන්සේට දැන්වූහ. එහිදී බුදුන්වහන්සේ එම අහිප්‍රේතයා කරන ලද පෙර කර්‍මය විස්තර කර දුන්සේක.

පෙර බරණැස් නුවර ගඟක් අසබඩ පන්සලක පසේ බුදුරජාණන් වහන්සේ නමක් වාසය කරයි. සැදැහැතියෝ උදෑසන දානය ද සවස ගිලන් පස ද රැගෙන මෙම පන්සලට යති. ඒ අසලම මිනිසෙක් කුඹුරක් කරයි. පන්සලට යන අය නිසා නියර කැඩේ. ගොයම් වැඩෙන කල්හි ඒවා මිනිසුන්ට පෑගෙති. කුඹුරට වන හානිය දුටු ගොවියා දැඩි කනස්සල්ලට පත් විය. කුඹුර මැඩගෙන නොයන ලෙස කොතරම් කීවත් පලක් වූයේ නැත. මේ නිසා පසේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි වෛරයක් හටගත්තේ ය. මෙතැන පන්සලක් නැත්නම් මාගේ කුඹුරට කරදර නොවෙයි. මෙසේ සිතා පසේ බුදුරජාණන් වහන්සේ පිඬු පිණිස වැඩි කල්හි පන්සලට ගොස් පැන් භාජන සහ ඇඳ පුටු ආදී සෙනසුන් බිඳු විනාශ කොට පන්සලට ගිනි තැබූ හ. පන්සල විනාශ වූ නිසා පසේ බුදුරජාණන් වහන්සේ අන් තැනකට වැඩම කළ හ. මේ බාලයා ඒ පවින් අපායේ ඉපිද දුක් විඳ නැවත අභිප්‍රේත නමින් ඉපිද දුක් විඳින සැටි පවසා "දෙවු කෙනෙහි කිරි නොමිදෙන්නාක් මෙන් " පාපය කළ කල්හි ඒ මොහොතේම විපාක නොදෙන බවත් එම පාපය කළ කල්හි ඒ මොහොතේම විපාක නොදෙන බවත් එම පාපය අලුයට සැගවුන ගිනි පුපුරක් මෙන් අනුවණයා දවන බව දේශනා කළසේක.

මෙම පෝය දිනයෙහි පෝය කිරීම් ආදී විනය කර්ම කොට පසුදින වස් විසීම උපසපන් භික්ෂූන් වහන්සේලාගේ චාරිත්‍රයකි. වෙනදාට වඩා ගිහි පැවිදි දෙපක්ෂයම පවින් වැලකී යහපතහි යෙදීම මේ කාලය තුළ සිදුවෙයි. සිගාලෝවාද සූත්‍රයෙහි සදිසාවේ උඩ දිශාව මහණ බමුණෝ ය. එහිදී සිඟාල නම් ගිහියා දායකයෙකු බවට පත්වේ. එම ගිහියා වෙනුවෙන් දක්වන යුතුකම් වලදී භික්ෂූන් වහන්සේලා වන අප ඔහු පවින් වලකාලිය යුතු යි. (පාපානිවාරෙනති) යහපතෙහි යෙදවිය යුතුයි. (කල්‍යාණෙ නිවෙසෙනති) දූ දරුවන් හදන වඩන දෙමාපියන් ද තම දරුවන් පවින් වලකා යහපතෙහි යෙදවිය යුතු යි. මේ උපදෙස්වලින් පැහැදිලි විය යුත්තේ පවින් වැලකී යහපතෙහි යෙදීම ගිහි පැවිදි ජීවිතවල පරමාදර්ශය බවයි.

නූතනයේ බොහෝ දෙනෙකුගේ මතය වී ඇත්තේ 2012 - 2013 යන වර්ෂ දෙකම කරදර විපත් බහුල කාලපරිච්ඡේදයක් බවයි. මෙය නරක එලයකි. මීට හේතුව කුමක් ද? ඊට හේතුව ජාතක පොතේ මහාසුපින ජාතකයේ සඳහන් වෙයි. එහි කෙසොල් රජතුමා සිහින 16 දැක බියට පත්වී ඒ සඳහා යාගයක් පිළියෙල කරයි. රාජ දේවිය වූ මල්ලිකා දේවියගේ මග පෙන්වීම මත යාගය නවත්වා බුදුරජාණන් වහන්සේ හමුවීමට යයි. එහිදී බුදුන් වහන්සේ රජතුමාට දේශනා කළේ රජතුමනි, ඔබ බිය වියයුතු නැත. ඔය සියලු විපත් සිදුවන්නේ අනාගත කාලයේදී බවයි. අනාගත කාලය යනු දැන් අප ජීවත් වන මේ කාලයයි. අනාගතෙ තිබබරාගා භවිසසනති යනුවෙන් දැක්වන්නේ අනාගත කාලයෙහි තීව්‍ර රාගය ඇතිවන බවයි. එවිට දෙවෂය ද තීව්‍ර  වෙයි. මෝහයද තීව්‍ර වේ. ලෝභ, ද්වේශ මෝහ යන නරක චිතතාවේග කෙලෙස් සහිත හැමදෙනා ළඟම පවතී. නමුත් මේ යුගය එම චිත්තාවේග ඉතා දරුණු ලෙස බලපවත්නා කාලයකි. පුවත් පතක් ගෙන බැලුවොත් පෙනෙන්නේ එවැනි දේමය. බාලයාට මේ කරුණු නොවැටහෙයි. ඒ නිසා ඔහු සතුටින් ජීවත් වීම සඳහා පව්කම් කරයි. ඒ පව් ඒ මොහොතේම විපාක නොදෙයි. යම් දිනෙක විපාක දෙන තත්වයට පත් වූ පසු අලුයට සැඟවී ඇති ගිනි පුපුර මෙන් ඔහු දවාලන්නේ ය.

එදා බරණැස ජීවත් වූ බාල ගොවියා හිතුවේ මේ පන්සල තිබුණොත් මාගේ කුඹුර විනාශ වන්නේය. ඒ නිසා පන්සල විනාශ කළ යුතුයි. එවැනි දරුණු අදහස් එන්නේ රාග, ද්වේශ, මෝහ තීව්‍ර වූ විටයි. ඒ අවස්ථාවේදී මේ බාලයා ඉතා සතුටින් කළ ඒ පාප කර්මය මෝරා විපාක දෙනවිට අපාගතවී දුක්විඳින්නට සිදුවිය. ඉන්පසුව අභිප්‍රේතයාවී ගින්නෙන් පිළිසෙන්නට විය. එදා සිදුවූ මේ තත්වය අදටද සියටට සීයයක්ම ගැලපෙන්නේ ය. ඒ නිසා බාල සංකල්පනාවන්ගෙන් මිදී ක්‍රියා කොට සසර කෙළවර කර ගැනීමට උත්සාවත් විය යුතුයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ පස් පව් ගැන විමසා බැලීමට කාලය උදාවී ඇත. එම පංචසීල ප්‍රතිපත්තිය ගැන බොහෝ බාලයින් කියන්නේ කිසිදු වැඩක් නැති ප්‍රතිපත්ති 5 බවයි. නූතනයේ බොහෝ දෙනා අද සංවර්ධනය ගැන කථා කරයි. විශාල මුදල් ප්‍රමාණයක් ඇති පුද්ගලයා අද බොහෝ දෙනා සලකන්නේ සංවර්ධිත පුද්ගලයෙකු ලෙසයි. එවැනි අයට පන්සිල් වධයක් වී තිබේ. ඔවුන් කියන්නේ පන්සිල් රැකීමට ගියොත් දිළින්දෙකු හැටියට ජීවත්වීමට සිදුවන බවයි. මුදලට මුල්තැන ලැබී සාරධර්ම වලට දෙවන තැන ලැබී තිබෙන මෙම යුගයෙහි බාලයින්ගේ සිත්වල බලපවත්වන්නේ ත්‍රීව්‍ර රාගය, ත්‍රීව්‍ර දේශය හා ත්‍රීව්‍ර මෝහය යි. ඒ නිසා අද සිදුවන දේ බලන්න. එවැනි දේ සිදුකරන අයගේ පව්කම් ඒ මොහොතේම විපාක නොදෙයි. නමුත් ඒ පව මෝරා විපාක දෙන අවස්ථාව වනවිට ඒ තුළින් බාලයා දැවේ. අභිප්‍රේතයා ගින්නෙන් දැවෙන්නාක් මෙනි. එහෙම උනොත් මේ බෞද්ධ කමෙන් ඇති වැඩේ කුමක් ද?

ප්‍රාණඝාත ශික්ෂාපදයෙහි කොටස් දෙකකි. විරමණ පක්ෂය හා ප්‍රතිග්‍රහණ පක්ෂයයි. සතුන් නොමැරීම, නොමැරවීම, ඒ සඳහා අවි ආයුධ නොගැනීම සතුන් බිය නොගැන්වීම ශික්ෂා පදයෙහි විරමණ (වෙන්වන) පක්ෂයයි. චාරිත්‍ර ශීලය හැටියට ගැනෙන්නේ එසේ වන වැලකීමයි. ඒ තුළ චාරිත්‍ර ශිලයක් ද ඇත. එය ශික්ෂාපදයෙහි ප්‍රතිග්‍රහණ පක්ෂයයි. (යෙදීමයි) එහිදී සතුන්ට ආදරය කළ යුතු අතර ඒ සතුන් විපතින් මුදවා ආරක්ෂා කරගත යුතුයි. මේ දෙපක්ෂයම සමබරව පවත්වාගෙන යා හැක්කේ ජීව පරිසරයට ආදරය කරන අයට පමණි. ඔහු මුදලට මුල් තැන නොදෙයි.

නමුත් මුදලට මුල් තැන ලැබී තිබෙන ත්‍රීව්‍ර රාගය ඇති නූතන සමාජයේ බොහෝ දෙනා උපන් සතුන් මෙන්ම ඉපදීමට සිටිනා සතුන්ගේ ද, ජීවිත තොර කරති. ඉතා සුළු මුදලකින් කෙනෙකුගේ ජීවිතය තොරකළ හැකි තත්වයට පත්වී තිබේ. ඉපදීමට සිටිනා සත්වයින්ගේ ජීවිත දිනකට කීයක් විනාශ කරන්නේ ද, මෙසේ කරමින් මුදල් උපයන බාලයින් ඒ මොහොතේම සතුටින් සිටියත් පාප කර්මය අලුයට ගිනි පුපුර මෙන් තිබී විපාක දෙන විට මහා දුකකට පැමිණෙන්නේය. සතුන් මැරීම හොඳ නැත. නමුත් ධීවරයෝ සතුන් මරති.  ඔවුන් කියන්නේ ඒ අපේ රැකියාව බවයි. මෝරෙකු අල්ලා බෝට්ටුවට ගනී. එම මෝරාගේ වරල් ටික කපාගෙන කඳ මුහුදට දමයි. මෝරු හත් අට දෙනෙකු අල්ලා වරල් ටික කපාගෙන කඳන් මුහුදට දමා එන්නේ එම මෝර වරල් වලින් අධික මුදලක් ලැබෙන බැවිනි. වරල් නැති මෝරු මුහුදේ මොනවා කරන්නද? ත්‍රිව්‍ර රාගය ඇති බොහෝ බාලයෝ

මෙවැනි පොලොව පවා නුහුලන පාප කර්ම කරති. මෝරා මරාගෙන අවුත් වරල්ටික වෙනම විකුණා මාළු ටික වෙනම විකුණා ජීවත් වීම වරදක් උවත් එය එක්තරා ක්‍රමානුකූළ බවක් පෙනේ. මෝරා මැරීම මෙයින් සාධාරණීකරණය නොකරමි. නමුත් මුදල් ලැබීමේ ආශාවෙන් ඉහත කී ආකාරයට කරන සත්ව ඝාතනය කොතරම් පාප කර්මයක් ද? එදා ජීවත් වූ ගොවියා මෙන් අද ජීවත් වන අණ්ඩබාලයින් මෙසේ මුදල් උපයා සතුටින් ජීවත් උනත් කවදා හෝ විපාක දෙන විට මහා දුකකට පත්වන්නේ ය. (පාණාතිපාතා)

දෙවන පාප කර්මය නොදුන්දේ ගැනීම නම් වූ සොරකමයි. එදා ශ්‍රී ලංකාවේ සත් රුවණින් පොදියක් බැඳ සත්දවසක් පාරේ මැද තිබුවත් එය ගන්නා අයෙකු නොවීය. අනුන්ට අයිති කෝටියක් උවත් තමන්ට උවමනා නැත යනුවෙන් සිතන පුද්ගලයා අන්සතු දේ නොගනී, එය ශික්ෂාපදයෙහි විරමණ පක්ෂයයි.

එමෙන්ම අන්සතු දේ ආරක්ෂා කරදීම ද අපේ යුතුකමයි. එය ශික්ෂාපදයේ ප්‍රතිග්‍රහණ පක්ෂයයි. නමුත් ඒ ගැන නොසිතන බොහෝ බාලයෝ සොරකම මුළු ජීවිතයේම ප්‍රධාන අංගය කොට සලකති. අද බොහෝ ව්‍යාපාරික ස්ථානවල කැමරා සවිකර තිබේ. හේතුව එම කඩවලට එන බොහෝ බාලයින් එම බඩු සොරාගෙන යන නිසාය. පසුගියදා මාතර රෙදි කඩයකින් රෙදි කච්චි දෙකක් සඟවාගෙන යන කාන්තාවන් දෙදෙනෙකු නීතියට හසුකරගත් බව පුවත්පතකින් දුටුවෙමි. ඒ සොරකම කළ බාල කාන්තාවන් දෙදෙනාට එම පව අලුයට සැඟවුනු ගිනි පුපුර මෙන් කවදා හෝ විපාක දෙන්නේ ය. සුළු ලාභයක් වෙනුවෙන් කළ එම පව මුළු ජීවිතයම දවා හලු කරන්නේ ය. (අදින්නාදානා)

තෙවන පාපකර්මය කාම මිත්‍යචාරයයි. කාමභෝගී ගිහියාට පස්කම් සැපත තහනම් කොට නැත. එහිදී ස්වාමිපුත්‍රයාට අවවාද කරන්නේ අනතිචාරී යනුවෙන් තම ස්වාමි දියණිය ඉක්මවා නොයායුතු බවයි. ස්වාමි දියණියට අවවාද කරන්නේ අනතිචාරිණී යනුවෙන් තම ස්වාමි පුත්‍රයා ඉක්මවා නොයා යුතු බවයි. මෙසේ යුග ජීවිතය දෙදෙනෙකු අතරේ පවත්නා සම්බන්ධයකට පමණක් සීමා කරගත යුතුයි. එය ශික්ෂාපදයේ විරමණ පක්ෂයයි. එසේ සමගියෙන් ජීවත් වන අඹුසැමියන්ගේ ජීවිත ආරක්ෂා කර දීමට කටයුතු කිරීම ශික්ෂා පදයේ ප්‍රතිග්‍රහණ පක්ෂයයි. නමුත් අද කාම මිථ්‍යාචාරය ඉතා ඉහළින් මුදල් උපයන ව්‍යාපාරයක් බවට පත්වී තිබේ. එසේ ක්‍රියා කරන බාලයින්ට එම පාප කර්මය අලුයට තිබු ගිනි පුපුරු මෙන් විපාක දෙන්නේ ය. (කමේසුමිච්ඡාචාරා)

සිව්වන පාප කර්මය මුසාවාදයයි. සමාජය මැනවින් ඉදිරියට පවත්වා ගැනීමට නම් සන්නිවේදනය සත්‍යවාදී විය යුතුයි. මගේ අදහසක් අනෙකාට දැන්වීමේදී අපි භාෂාවේ වචන භාවිතා කරමු. ඒ වචන බොරුවෙන් තොර විය යුතුයි. එය ශික්ෂා පදයේ විරමණ පක්ෂයයි. එසේම සත්‍යවාදී වචනයක්ම ප්‍රකාශ කළ යුතුයි. නමුත් නූතනයේ බොරු කී තරමට මුදල් ඉපයිය හැක. එසේ මුදල් උපයන බාලයින් ඉතා සතුටින් ජීවත් වන බව පෙනේ. නමුත් එම සතුට තාවකාලිකයි. තම කරන ලද බොරු නැමති පව් අලුයට තිබු ගිනි පුපුරුමෙන් තම ජීවිතය පුළුස්සා දමනු ඇත. (මුසාවාදා)

පස්වන පාප කර්මය මදයට හා ප්‍රමාදයට හේතුවන සුරාවයි. එවැනි දේවලින් ඈත්වී සිටීම ශික්ෂා පදයේ විරමණ පක්ෂය වන අතර එවැනි දේට සමාජය තුළ ඉඩ නොතබා සියලු දෙනා ආරක්ෂා කර ගැනීම ප්‍රතිග්‍රහණ පක්ෂයයි.

නමුත් නූතනයේ තීව්‍ර රාගය ඇති මිනිසුන් සිතන්නේ මුදල් ඉපයීමට තිබෙන හොඳම ක්‍රමය මෙම සුරාව බවයි. එසේ සිතා තමනුත් විනාශ වී සමාජයමත් විනාශවන හැටි දැකගත හැකියි. (සුරාමෙරය මජ්ජ පමා දට්ඨානා)

ඉහත සඳහන් කළ ආකාරයට නූතනිකයා නිතර කල්පනා කළ යුත්තේ පවින් වැලකී පින් දහම් කරගත යුතු බවයි. අදින් ආරම්භවන වස් කාලය තුළ ගිහි පැවිදි අප හැම දෙනාම පවින් වැලකී යහපතෙහි යෙදීමට අධිෂ්ඨාන කරගත යුතුයි. එසේ කළොත් 2012 - 2013 වර්ෂවල සිදුවන බරපතල කරදර අවම කරගත හැකි ය.